# හංසයාට - පොහොට්ටුවට පැෆ්රල් වෙතින් චෝදනා

[දිනුක **මලින්ද හේරත්**]

2019 ජනාධිපතිවරණය තුළ ප්‍රධාන පක්ෂවල අපේක්ෂකයන්ට සහාය දැක්වීම සඳහා මැතිවරණ උපමානයන් උල්ලංඝනය කරමින් රාජ්‍ය දේපළ බහුල වශයෙන් අවභාවිත කරමින් සිටින බව පැෆ්රල් සංවිධානය ඊයේ (21) නිවේදනයක් නිකුත් කරමින් කියා සිටී.

මේ වනවිට පැෆ්රල් සංවිධානයට ලැබී ඇති මැතිවරණ නීති උල්ලංඝනයන් විශ්ලේෂණය කර බලන විට පැමිණිලි 135 කින් 65ක් එනම් සියයට 48ක් පමණ අයුතු ලෙස මහජන දේපළ සහ දේශපාලන බලය පක්ෂ හෝ අපේක්ෂකයන් ප්‍රවර්ධනය කිරීමට යොදා ගත් ඒවා වේ. ජනාධිපතිවරණය නියාමනය කරනු ලබන නෛතික උපමානයන්ට අනුව කිසිදු රාජ්‍ය දේපළක් දේශපාලන කටයුතු සඳහා යොදා ගැනීමට නොහැකි නමුත් ප්‍රසිද්ධියේ මෙම නීති උල්ලංඝනය කෙරෙමින් පවතින බව පැෆ්රල් සංවිධානය කියා සිටියේය.

මධ්‍යම ආණ්ඩුවට ආයත් කාර්යාලවල මෙන්ම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විසින් පාලනය කරනු ලබන ප්‍රාදේශීය සභා ඇතුළු පළාත් පාලන ආයතන තුළද දැඩි ලෙස රාජ්‍ය දේපළ සහ පුද්ගලයන් අවභාවිත කරන අයුරු දක්නට ලැබේ. ඔවුන් පළාත් පාලන ආයතනවල බලය අයුතු ලෙස උපයෝගී කරගෙන තම පක්ෂයේ අපේක්ෂකයා වූ ගෝඨාභය රාජපක්ෂ මහතා දිනවීමට කටයුතු කරන බව පැෆ්රල් සංවිධානය කියයි. එසේම පළාත් සභා නියෝජනය කරනු ලබන ආණ්ඩුකාරවරුන් දෙදෙනෙකු ප්‍රධාන අපේක්ෂකයෙකුගේ මැතිවරණ ව්‍යාපාරයට සම්බන්ධව කටයුතු කරන බව පැෆ්රල් සංවිධානය කියා සිටියේය.

හදිසියේ ආරම්භ කරනු ලබන මහජන ශුභසාධන වැඩසටහන් මෙන්ම රජයේ රැකියා ප්‍රදානය කිරීම්, නව බඳවා ගැනීම්, ව්‍යාපෘති විවෘත කිරීම්, මහජන සේවාවන් ලබාදීමේ සායන ආදිය මධ්‍යම ආණ්ඩුව මෙන්ම පළාත් සභා සහ පළාත් පාලන මට්ටමින් මෙම මැතිවරණ කාලසීමාවේදී ක්‍රියාත්මක වෙමින් තිබේ. එබැවින් මෙවැනි ක්‍රියා පාලනය කිරීම මැතිවරණ කොමිසම ගනු ලබන ක්‍රියාමාර්ගවලට සියලු පක්ෂ අපේක්ෂකයන් සහාය ලබාදිය යුතු බව එම නිවේදනයේ වැඩිදුරටත් සඳහන් වේ.